**ජාතික තරුණ සේවා සභාව - 2019**
**-------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

ජාතික තරුණ සේවා සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 ඡේදයට අනුව කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් සියළුම ආදායම් හා වියදම් අයිතම, ලාභ හෝ අලාභ වල ඇතුළත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාලව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු එකතුව රු. 15,479,900 ක් ගිණුම්ගත කර නොතිබූ අතර පෙර වර්ෂයට අදාලව ගෙවන ලද එකතුව රු. 61,793,120 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු. 45,982,593 ක් විය යුතු ලාභය රු. 330,627 ක ඌනතාවයක් වී තිබුණි. | 2018 සහ 2019 වර්ෂවල වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුකොට ගෙන එම වියදම් උපචිත වියදම් ලෙස ගිණුම් ගත කිරීමට නොහැකි විය. ඉදිරියේදී මෙම වියදම් උපචිත වියදම් ලෙස ගිණුම් ගත කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු. 941,356,738 ක් වූ වත්කම් වර්ග 3 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 07 අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම ඉදිරියේදී කටයුතු කර දළ ධාරන අගය ගිණුම් වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 15 ඡේදයට අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකමින් අඩු අගයට තොග අගය කළ යුතු වුවද, සභාව විසින් පිරිවැයට අගය කරන පරිදි තොග ප්‍රතිපත්තිය හඳුනාගෙන තිබුණි. | වර්ෂ අවසාන තොග ගණනය කිරීම පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි අගය යන වටිනාකමින් අඩු අගයට ගණනය කිරීම 2020 වර්ෂයේදී කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව තොග ප්‍රතිපත්තිය හඳුනාගත යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික තරුණ සේවා සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 761,782,870 ක් වූ කෙරීගෙන යන වැඩ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ දැක්විය යුතු වුවද ජංගම වත්කම් යටතේ දක්වා තිබූ අතර ඒ තුළ 2018 වර්ෂයේ දී වැඩ නිමකළ එකතුව රු. 247,717,101 ක් වූ ගොඩනැගිලි වටිනාකම ඇතුළත් වී තිබුණි. | ජංගම වත්කම් ලෙස පෙන්වා ඇති කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය සහ අවසන් බිල්පත නොගෙවූ රු. 247,711,101ක් වූ ගොඩනැගිලි වටිනාකම 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | වත්කම් නිවරදිව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ ඉඩම් 05 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | මාතර දකුණු පළාත් කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩම තක්සේරු කර ලැබී ඇත. එම වටිනාකම 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ගැලපීමට කටයුතු කරනු ඇත. අනෙකුත් ඉඩම්ද තක්සේරු කර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට මා විසින් උපදෙස් දී ඇත . | සභාවට නීත්‍යානුකූල අයිතිය හිමි වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 හි සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීමෙහි 40 වන ජේදයට අනුව, ප්‍රධාන කළමනාකාර පිරිසගේ සමුච්චිත පාරිශ්‍රමිකය හෙළිදරව් කල යුතු වුවද, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ සභාපති සහ සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමයේ සභාපති ලෙස සභාවේ සභාපති කටයුතු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී, වාර්ෂික දීමනා ලෙස පිළිවෙලින් එකතුව රු. 200,000 ක් හා රු. 75,000 ක් ලබාගැනීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිත අංක 14 අනුව අදාල තොරතුරු හෙලිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය තොරතුරු හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 හි සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීමෙහි 40 වන ජේදයට අනුව, ප්‍රධාන කළමනාකාර පිරිසගේ සමුච්චිත පාරිශ්‍රමිකය හෙළිදරව් කල යුතු වුවද, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ සභාපති සහ සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමයේ සභාපති ලෙස සභාවේ සභාපති කටයුතු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී, වාර්ෂික දීමනා ලෙස පිළිවෙලින් එකතුව රු. 200,000 ක් හා රු. 75,000 ක් ලබාගැනීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිත අංක 14 අනුව අදාල තොරතුරු හෙලිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය තොරතුරු හෙළිදරව් කළ යුතුය. |

**1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු ණය හිමි ශේෂය | 110,000 | 49,229,360 | 49,119,360 | ණයහිමි ලෙස සඳහන් රු. 110,000 ක ශේෂය අතපසුවීමකින් 2015 වර්ෂයේදී වැඩිපුර ගිණුම් ගතවූ ගිණුම්කරණ දෝෂයක් බැවින්,එය 2020 වර්ෂයේදි පූර්ව වර්ෂ ගැලපීම් ලෙස මේ වන විට නිවැරදි කර ඇත. | සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු ණය ශේෂ අදාල සමාගම් තොරතුරු සමඟ පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.6 ඒකාබද්ධ කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික තරුණ සේවා සභාව සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව 1981 වර්ෂයේදී සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම ආරම්භ කර තිබුණද සභාව විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමාලෝචිත වර්ෂය දක්වාම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම සමාගම විසින් 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම මේ වන විට ගිණුම් සකස් කර ඇත්තේ 2017-12-31 දින දක්වා පමණි. ඉදිරියේදී තරුණ සේවා සමාගමේ ගිණුම් යාවත්කාලීන වන පරිදි අවශ්‍ය ගිණුම් සකස් කරන ලෙස දැනටමත් කළමණාකරණය වෙත දැනුම් දී ඇත. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ දිගින් දිගටම කළමනාකරණය දැනුවත් කර තිබූ අතර ඒ පිළිබඳ අවධානය යොමු කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ ණය හිමියන් යටතේ වූ වසර 02 කට වඩා පැරණි එකතුව රු. 1,986,304 ක ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | යෞවන සමාජ සම්මේලනයේ රු. 269,972 ක මුදලක් මේ වන විට ගෙවා ඇති අතර ඉතිරි ශේෂයන් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | දීර්ඝ කාලයක සිට පැවතෙන ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදායට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 5.2.1 වගන්තිය | මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු නොපමාව පිරවීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා පත්වීම් බලධාරියාට දැනුම්දීමෙන් තොරව 2011 වර්ෂයේ සිට සභාවේ පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ තනතුරු 28 ක් සඳහා දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරීන් 21 දෙනෙකු හා මූල්‍ය නිලධාරී එම තනතුරු වල රාජකාරී ඉටු කිරීමේ පදනම මත 2017 වර්ෂයේ සිට පත් කර තිබුණි. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමට ලිපියක් ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලද වහාම අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ උපදෙස් පරිදි පුරප්පාඩු පවතින තනතුරු සඳහා සුදුසු නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ජාතික තරුණ සේවා සභාවට අයත් ජාතික තරුණ මධ්‍යස්ථාන ක්‍රීඩා | ජාතික තරුණ සේවා සභාව පරිශ්‍රයේ පවත්වාගෙන යන ක්‍රීඩා සමාජයේ පරිපාලන හා මූල්‍ය කටයුතු විධිමත්ව සිදුනොවන බැවින්, ක්‍රීඩා | අරමුදල් ආයෝජනය කිරීමේදී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාජය විසින් 2019 දෙසැම්බර් 31 දින වන විට රු. 10,157,722 ක මුදලක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. | සමාජයේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරමින් පවතී. | |
| (ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 (ඇ) | 2019 යොවුන්පුර වැඩසටහනෙහි ප්‍රදර්ශන කුටි හා ප්‍රධාන වේදිකාව ප්‍රසම්පාදනය සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව සභාවේ සේවය කරන නිලධාරීන්ගෙන් පමණක් සමන්විත වී තිබුණි. | වර්තමානයේ ජාතික වැඩසටහන්වලදී හා ඉහළ වටිනාකමින් යුක්ත මිලදී ගැනීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමට උපදෙස් ලබාදීමට සටහන් කර ගතිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් පත්කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 330,627,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 109,356,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 221,271,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වර්ෂයේ ආදායම රු. 29,268,000 කින් වැඩි වුවද, වර්ෂයේ මෙහෙයුම් වියදම රු. 240,588,000 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා තාරුණ්‍යයේ කාලීන අවශ්‍යතාවය හා වුවමනාවන් අවස්ථානුකූලව කළමනාකරණය ඇතුළු ප්‍රධාන අරමුණු 05 ක් යටතේ ජාතික තරුණ සේවා සභාව විසින් 2019 මාර්තු 26 දින දෙබරවැව මහජන ක්‍රීඩාංගණයේ දී යොවුන්පුර වැඩසටහන පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එහෙත් ඊට පටහැනිව | මෙම වියදම් දැරීමට හේතුවූයේ අක්කර 110 ක භූමි ප්‍රදේශයක් තුළ වැඩ සටහන පැවැත්වීම, ජාත්‍යන්තර වැඩසටහන් වලදී සිහිවටන ලබාදීම නිසාත්, තරුණ තරුණියන්ගේ උද්යෝගය වැඩි කිරීම සඳහාත් අග්‍රාමාත්‍යවරයාගේ සහභාගීත්වයහා විශාල මහජන නිජෝජිතයින් හා ඉහළ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් සහභාගී වීම | සභාව විසින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ආර්ථික බව හා ඵලදායී බව පිළිබඳ අවධානය යොමු කර වියදම් දැරීම් සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රදර්ශනාත්මක හා විනෝදකාමී අංගයන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් තොරණ් 03 ක් ඉදිකිරීම, දින 05 ක් පුරා රාත්‍රී සංගීත ප්‍රසංග පැවැත්වීම, තාවකාලික සිනමා ශාලා ඉදිකිරීම යනාදී යොවුන්පුර වැඩසටහනේ අරමුණු සමග ඍජු සම්බන්ධතාවයක් නොමැති කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 40,593,305 ක් වැයකර තිබුණි. | නිසාත්, විදේශීය තරුණයින් සහභාගී වීම නිසාත් ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැලසීම ලෙසත්ය. | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ පවත්වන ලද යොවුන්පුර වැඩසටහන සඳහා අනුමත ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 200 ක් වුවද, එය ඉක්මවා රු. 53,992,874 ක් වැය කර තිබුණි. මෙම වැඩසටහනට අවශ්‍ය ගබඩා ඩෝම්ස් දෙකක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියට පරිබාහිරව, ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එම ඩෝම්ස් සඳහා ඇණවුම් කළ දින ප්‍රමාණය ඉක්මවා දින 8 සිට දින 10 දක්වා කාලයක් භාවිතා කළ බව සඳහන් කරමින් එකතුව රු. 2,227,400 ක් වැඩිපුර ගෙවා තිබුණි. | විගණන විමසුමට ලක්වී ඇති කරුණු පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දැනුම් දී ඇත. | මෙම කටයුත්තේදී සභාවට යම් අලාභයක් සිදුවී තිබේද යන්න සහ එසේ අලාභ සිදුවී තිබේනම් එම අලාභ අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සභාවේ නිල නිවාස භාවිතා කරන නිලධාරීන් 90 දෙනෙකුගෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.4, 5.4.1, 5.5, 5.7 හා 5.8 උප වගන්ති හා 2016 අගෝස්තු 26 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි අදාල නිලධාරියාගේ වැටුපෙන් නිවාස කුලී හා ජලය හා විදුලිය භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීම සිදු කර නොතිබුණි. විගණනය වෙත ලබා දෙන ලද තොරතුරු මත සිදු කරනු ලැබූ ගණනය කිරීම් අනුව, සමාලෝචිත වර්ෂය තුළ දී පමණක් නිලධාරීන් 46 දෙනෙකුගෙන් රු. 1,878,238 ක පමණ නිවාස කුලියක් අයවිය යුතුව තිබුණි. | මුදල් අයවීම් සම්බන්ධයෙන් ප්‍රගතිය සාර්ථක තත්ත්වයක නොමැති හෙයින්, ඒ පිළිබඳව විවිධ ගැටළු, ප්‍රශ්න නිලධාරීන් විසින් යොමුකරමින් සිටින අතර, ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුව අදාළ නිල නිවාසවල පවතින පහසුකම් හා තත්ත්වයන් පිළිබඳව පැහැදිලි කර ගැනීමක්ද කළයුතු දැයි විශ්වාස කරන අතර, එයද අදාළ කමිටුව වෙත යොමුකර වඩාත් සාධාරණවූ තීරණයක් ගත යුතුව ඇති බැව් නිරීක්ෂණය කරමි. | සභාවට අයත් නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයට අනුව අයවිය යුතු මුදල් අයකරගැනීම සහ ඊට අදාල අනෙකුත් ගැටළු සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ජාතික තරුණ සේවා සභාවේ සභාපතිගේ සභාපතීත්වයෙන් හා සභාවේ ස්ථිර වැටුප් ලබන නිලධාරීයකු පූර්ණකාලීනව සේවයේ යොදවමින් සභාව තුළ ක්‍රීඩා සමාජයක් පවත්වාගෙන යනු ලබන අතර එහි පුහුණුවීම් කටයුතු සඳහා කිසිදු ගාස්තුවක් ගෙවීමකින් තොරව සභාවේ සම්පත් උපයෝගී කර ගෙන තිබුණි.<br><br>ක්‍රීඩා සමාජයේ කටයුතු වෙනුවෙන් ක්‍රීඩා උපදේශකවරුන් සහ සභාවේ නිලධාරියකු වෙත සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 2,621,130 ක් සභාවේ අරමුදලින් වැයකර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය නිම වන විට වර්ෂයට අදාළ සාමාජික ගාස්තු ලෙස රු. 5,518,150 ක් ක්‍රීඩා සමාජය අය කර තිබූ අතර එකතුව රු. 10,157,722 ක ස්ථාවර තැන්පතු හා රු. 7,104,863 ක ඉතිරිකිරීම් පැවතියද එහි මූල්‍ය කටයුතු සභාවේ පාලනයකින් තොරව පවත්වා ගෙන යනු ලබන බව නිරීක්ෂණය විය. | ජාතික තරුණ සේවා සභාව පරිශ්‍රයේ පවත්වාගෙන යන ක්‍රීඩා සමාජයේ පරිපාලන හා මූල්‍ය කටයුතු විධිමත්ව සිදුනොවන බැවින්, ක්‍රීඩා සමාජයේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරමින් පවතී. | ක්‍රීඩා සමාජයේ පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) ජාතික තරුණ සේවා සභාවේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා ගාස්තු සම්බන්ධ ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම අරමුණු කර තිබුණද 2019 වර්ෂය අවසන් වන විටත් පාඨමාලා ගාස්තු සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබූ අතර සභාව යටතේ වූ පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාත්මක වන එකම පාඨමාලාව සඳහා විවිධ ගාස්තු අයකරමින් පාඨමාලා ආරම්භකර ක්‍රියාත්මක කර තිබුණි. | ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන පූර්ණ කාලීන පාඨමාලා, අර්ධ කාලීන පාඨමාලා සහ කෙටි කාලීන පාඨමාලා 2020 දෙවන අධ්‍යයන වාරයේ සිට ස්වාධීනකරණය කර නිශ්චිත පාඨමාලා ප්‍රමාණයක් නිශ්චිත ගාස්තුවක් යටතේ ක්‍රියාත්මක කිරීමට මේ වන විට කෙටුම්පත් කර ඇති අතර 2020 දෙවන අධ්‍යයන වාරයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. | පාඨමාලා ගාස්තු අයකිරීමට අදාලව විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක විය යුතුය. |
| (ඉ) ජාතික තරුණ සේවා සභාවේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ අඩු වරප්‍රසාද සහිත සිසුන් 100 දෙනෙකු වෙනුවෙන් වසරකට රු. මිලියන 4.8 බැගින් ලබාදීම සඳහා රු. මිලියන 33.6 ක් වෙන්කර තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මගින් ක්‍රියාකාරී සැලැස්ම අනුව මූල්‍ය සහාය අවශ්‍ය අභ්‍යාසලාභීන් සඳහා මූල්‍යමය සහය ලබාදීමට 2014 – 2020 ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද මෙතෙක් ජාතික තරුණ සේවා සභාව වෙත නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මගින් ප්‍රතිපාදන ලබාදී නොමැත. | අඩු වරප්‍රසාද සහිත තරුණ තරුණියන් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට යොමු කරගැනීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ සභාව විසින් පිළියෙළ කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව අතිරේක පුහුණු අභ්‍යාසලාභීන් 1700 ක් බිහිකිරිම සඳහා පුහුණු මධ්‍යස්ථාන 10 ක් නවීකරණය කිරීමට රු. මිලියන 611 ක් වෙන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විට රු. මිලියන 428 ක් වැය කර මධ්‍යස්ථාන 6ක් නවීකරණය කර තිබුණ ද ඉන් පුහුණු මධ්‍යස්ථාන තුනක නවීකරණ කටයුතු කොන්ත්‍රාත්කරුගේ දුර්වලතා හා ඉදිකිරීම් කටයුතු වල මන්දගාමී ස්වභාවය හේතුවෙන් රු. මිලියන 165.2 ක් වැය දැරීමෙන් පසු ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා තිබුණි. | විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව, ජාතික තරුණ සේවා සභාව විසින් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනහි මූල්‍ය ප්‍රතිපාදන මත පුහුණු මධ්‍යස්ථාන 10 ක නවීකරණ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වුවද, මධ්‍යස්ථාන 6 ක පමණක් නවීකරණ කටයුතු සිදු කරන ලදී. තවද, පුහුණු මධ්‍යස්ථාන 3 ක නවීකරණ කටයුතු නිමකර පාඨමාලා ආරම්භ කරන ලදී. | ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් පවතින දුර්වල පරිපාලන තත්ත්වය නිවැරදි කිරීම සඳහා නිසි අධීක්ෂණයකින් යුතුව එම කටයුතු ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව විසින් 2018 වර්ෂයේදී තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 1,100 ක් ආරම්භ කර 2018 නොවැම්බර් 15 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. 2018 හා 2019 වර්ෂ වලදී මෙම ව්‍යාපෘති සඳහා රු. 206,477,640 ක් වැයකර තිබුණ ද 2019 ජූලි 31 වන විට එම ව්‍යාපෘතිවලින්, ව්‍යාපෘති 185 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ව්‍යාපෘති 471 ක වැඩ නිම කර නොතිබුණි. | මෙහිදී අවසන් කර නොමැති ව්‍යාපෘති 471 ක් ලෙස සඳහන් කළද එම ඒකාය තුළ ව්‍යාපෘති 1100 න් ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති 185 ක් ද ඇතුළත් වේ. කෙසේ වෙතත්, 2018 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාද වී ලැබීම හේතුවෙන් 2018 අගෝස්තු 31 දින නිදහස් කර ඇත්තේ මිලියන 50 ක් පමණි. එම හේතුවෙන් ඇතැම් තෝරාගත් ව්‍යාපෘති ආරම්භ කිරීමේ ප්‍රමාදයක් සිදුවී ඇත. | සභාව විසින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති විධිමත් පරිදි සැලසුම්කර මනා අධික්ෂණයක් යටතේ ක්‍රියාත්මක කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) සභාවේ විශේෂ ව්‍යාපෘති අංශය විසින් ඉදිරිපත් කර තිබූ 2019 ජුනි 6 දිනැති ප්‍රගති වාර්තාව අනුව 2017 වර්ෂයේදී රු. 406,843,820 ක් වැයකර තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 3000 ක් ක්‍රියාත්මක කර තිබුණි. ඉන් ව්‍යාපෘති 66 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර වැඩ අවසන් කර නොතිබූ ව්‍යාපෘති 206 න් ව්‍යාපෘති 47 ක භෞතික ප්‍රගතිය සියයට 75 ක් හෝ ඊට අඩු අගයක් ගෙන තිබුණි. | ප්‍රජා දායකත්වය යෞවන සමාජය වෙත නිසි පරිදි නොලැබීම, භෞතික හා මූල්‍ය සම්පත් ලැබීම ප්‍රමාද වීම. ස්වාභාවික ආපදා තත්ත්වයක් යන කරුණු නිසා නතර වී ඇති බව නිරීක්ෂණය විය. නිලධාරීන්ගේ අකාර්යක්ෂම හෝ වංචනික කටයුතු හේතුවෙන් ක්‍රියාත්මක නොවී ඇති බව වාර්තාවන නිලධාරීන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට අදාල අංශ වෙත යොමු කරමින් සිටී. | විශේෂ ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණ ඉටුවන පරිදි සැලසුම් පිළියෙල කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික තරුණ සේවා සභාවේ 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ වැඩසටහන් සඳහා රු. මිලියන 70.10 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2019 දෙසැම්බර් 31 දින ප්‍රගති වාර්තාව අනුව සැලැස්මේ ක්‍රියාකාරකම් සඳහා රු. මිලියන 26.60 එනම් සියයට 38 ක් වැය කර නොතිබුණි. | 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 70.10 ක් ලබාදී තිබුණද පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු අවසන් නොවීම නිසා අනුමත ප්‍රතිපාදන වැය දැරීමට නොහැකි විය. | විවිධ ව්‍යාපෘති සහ වැඩසටහන් යටතේ සභාව වෙත ලැබෙන ප්‍රතිපාදන උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක විය යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සබරගමුව පළාත් කාර්යාලය විසින් බටංගල පුහුණු මධ්‍යස්ථානයට සූපවේදී උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය විසින් ලබා දී තිබූ රු. 1,998,556 ක මුදලින් විධිමත් අනුමැතියකින් තොරව රු. 998,771 ක් වැයකර බේකරි පාඨමාලා උපකරණ මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5, 3.4.3, 3.4.4, 5.3.7 (අ) සහ 6.9.1 (අ) ඡේද වලට පටහැනිව මිල ගණන් කැඳවීම හා කොන්ත්‍රාත් ප්‍රදානයට අදාළ ලිපි යැවීම සිදු කර තිබුණි. එසේම මෙම ප්‍රසම්පාදනය සඳහා විධිමත් ගිවිසුමක් නොතිබූ අතර භාණ්ඩ භාර ගැනීමේ තුණ්ඩුවේ සඳහන් දිනයේ සිට දින 38 කට පසු මධ්‍යස්ථානය වෙත භාණ්ඩ භාර දී තිබුණි. තවද විගණිත දිනය වූ 2019 ඔක්තෝබර් 03 දක්වාම පාඨමාලා ආරම්භ කර නොතිබීම හේතුවෙන් මාස 09 ක කාලයක් භාණ්ඩ නිෂ්කාර්යව පැවතුණි. | බටංගල පුහුණු මධ්‍යස්ථානයට ලබාදී තිබූ සූපවේදී උපකරණ අදාල බේකරි පාඨමාලාව එම මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මෙම උපකරණ මහරගම තරුණ මධ්‍යස්ථානය වෙත මාරුකරන ලදී. ඒ අනුව මේ වන විට මෙම උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කරගන්නා බව පෙන්වා දෙමි. | පළාත් කාර්යාල මගින් සිදු කරන මිලදී ගැනීම් වලදී භාණ්ඩවල අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මාර්ගෝපදේශවලට අනුකූලව සිදුකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 04 වන ඡේදයේ සඳහන් අවශ්‍යතාවය ඉටුවන පරිදි සභාවේ පුහුණු මධ්‍යස්ථාන හා කාර්යාල 28 ක වේලා | ක්‍රියා විරහිත තත්ත්වයේ පවත්නා යන්ත්‍ර අළුත්වැඩියා කිරීමටත් මෘදුකාංග ඇතුළත් කිරීමටත්, මෘදුකාංග සම්බන්ධයෙන් පවත්නා තාක්ෂණික දෝෂ නිරවුල් කිරීමටත්, | අදාළ චක්‍රලේඛ විධිවිධාන වලට අනුගතව කටයුතු කළ යුතු අතර සවිකර තිබූ යන්ත්‍ර ක්‍රියාවිරහිත වීම සම්බන්ධයෙන් |

| | | |
|---|---|---|
| සටහන් යන්ත්‍ර සවිකර නොතිබූ අතර 2013 වර්ෂයේ දී රු. 2,467,298 ක් වැයකර පුහුණු මධ්‍යස්ථාන වල සවි කර තිබූ යන්ත්‍ර 56 කින් යන්ත්‍ර 53 ක් ක්‍රියා විරහිතව තිබීම හේතුවෙන් අදාළ වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත් වී තිබුණි. | සවි නොකර ඇති යන්ත්‍ර සවිකිරීමට අදාළ සැපයුම්කරු වෙත දැනුම් දී ඇති අතර පළාත් මට්ටමින් එම කටයුතු සිදුකරවා ගැනීමට සැලසුම් කර ඇත. තවද, මෙම ප්‍රසම්පාදනයේ ඉටුකරවා ගැනීමට ඇති කාර්යය වටිනාකම වෙනුවෙන් කාර්යසාධන ඇපකරයක් ලබාගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික තරුණ සේවා සභාවේ සබරගමුව පළාත් කාර්යාලය විසින් මෝටර් කාර්මික පාඨමාලාවට අදාලව රු. 922,870 ක් වටිනා පුහුණු උපකරණ මිලදී ගැනීමට 2018 දෙසැම්බර් 31 දින ඇනවුම් කර තිබුණද භාණ්ඩ භාරගැනීමේ කුවිතාන්සිය අනුව ඇනවුම් කරන ලද දිනට පෙර එනම් 2018 දෙසැම්බර් 20 දින ගබඩාවට භාණ්ඩ ලැබී තිබුණි. | කළමනාකරණය විසින් අදහස් ඉදිරිපත් කර නොමැත. | මෙම ගනුදෙනුව පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සිදු කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය නිමවන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක තරුණ කටයුතු සම්බන්ධීකරණය වෙනුවෙන් තරුණ සේවා නිලධාරීන් 11 දෙනෙකු පත්කර නොතිබුණි. එහෙත් අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ප්‍රතිපාදනයන්ට පටහැනිව සහ ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා අනුමත රු. 300 ක මාසික දීමනාවද ගෙවමින්, විවිධ ශ්‍රේණිවලට අයත් තරුණ සේවා නිලධාරීන් 173 දෙනෙකු, ප්‍රධාන කාර්යාලයේ, පුහුණු මධ්‍යස්ථානවල සහ ප්‍රාදේශීය කාර්යාලවල විවිධ රාජකාරි සඳහා යොදවා තිබුණි. | 2020.10.26 දිනැතිව නිකුත් කරනු ලැබූ කළමනාකරණ සේවා චක්‍රලේඛ DMS/CIR/2020 හි සඳහන් උපදෙස් අනුව පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීම ප්‍රමාණවත් බැවින් 2020.11.16 දිනැතිව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් වෙත පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබාගැනීම සඳහා ලිපියක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව අනුමැතිය ලද වහාම අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | තරුණ සේවා නිලධාරීන්ට අදාල රාජකාරිවල එම නිලධාරීන් යෙදවීමට කටයුතු කළ යුතුය. එසේම තරුණ කටයුතු සම්බන්ධීකරණ නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව, ජාතික තරුණ සේවා සභාවේ නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ වන පුහුණු මධ්‍යස්ථාන සඳහා උපදේශකවරුන් 55 දෙනෙකු බඳවා ගනිමින් අධ්‍යයන කාර්යය මණ්ඩලය සියයට 80ක් දක්වා වර්ධනය කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට උපදේශකවරුන් 34 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. | ජාතික තරුණ සේවා සභාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව 2019 වර්ෂය සඳහා උපදේශකවරුන් 65 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ වෘත්තීය පුහුණු අංශය වෙත උපදේශකවරුන් 34 ක් බඳවාගෙන තිබුණි. කෙසේ වුවද, 2020 අගෝස්තු 31 වන දිනට ජාතික තරුණ සේවා සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ උපදේශකවරුන් ප්‍රමාණය සියයට 82 ක් දක්වා සම්පූර්ණ වී තිබුණි. | පුහුණු අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් හා සුදුසුකම්ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් පත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

### 4.1 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර ජාතික තරුණ සේවා සභාව විසින් තම විෂය පථයට ගැනෙන තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට අදාළ දැනුවත් කිරීම් කර ඇති අතර, 2018.06.04 වන දින රාජ්‍ය ආයතන විසින් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම්වීම පිළිබඳ ප්‍රශ්ණාවලිය සම්පූර්ණ කර යවා ඇත. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |